# සමාජ වෙනස් වීම සහ අධ්‍යාපනය

**ඒ.සී. ඉමේෂා කිංකිණි**

සමාජ වෙනස් වීමක් යනු, යම් සමූහයක සිරිත් විරිත්, විශ්වාසයන්, නීති සහ ආයතනවල සිදු වන පරිවර්තනයක් ලෙස හැඳින්විය හැකි ය. සමාජ වෙනස් වීමක් ආකාර දෙකකින් සිදුවිය හැකි ය. එනම්, ක්‍රමානුකූල ව සිදුවන ධනාත්මක වෙනසක් හෝ ඍණාත්මක වෙනසක් ය (Wilterdink & William 2020, November 16). කෙසේ වෙතත්, සමාජ විපර්යාසයට පහසුකම් සැපයිය හැකි විවිධ සාධක තිබුණ ද අධ්‍යාපනය යනු විශ්වීය වශයෙන් පිළිගත් ක්‍රමය යි.

අධ්‍යාපනය හා සමාජ වෙනස්වීම යනු, එකිනෙකට අවියෝජනීය සම්බන්ධතාවක් ඇති සංකල්ප දෙකකි. සමාජය කොතරම් ශීඝ්‍ර වෙනසකට භාජනය වන්නේ ද යන්න සමාජ මානව විද්‍යාඥවරියක වන මාග්‍රට් මීඩ් මෙනවියගේ ප්‍රකාශයෙන් මනාව පැහැදිලි වේ. එනම් "වේගයෙන් වෙනස් වන වත්මන් හා අනාගත සමාජය ගැන ඇය පවසා ඇත්තේ මෙතැන් සිට කිසිවකු තමන් ඉපදුණු ලෝකයේ මුළු ජීවිත කාලය ම ජීවත් නොවේ. එමෙන් ම තමුන් වැඩ කළ ලෝකයේ කිසිවකු මිය නොයයි..., (no one will live all his life in the world into he was born" and no one will die in the world in which he worked) යනුවෙනි.

වෙනස් වන සමාජයක් සඳහා පාසල් සහ විශ්ව විද්‍යාල මිනිසුන් සූදානම් කරන්නේ කෙසේ ද?

Gurria, A. (2009). පෙන්වා දෙන්නේ මේ සඳහා පිළිතුරු පවතින්නේ අධ්‍යාපනයේ බවයි. එහෙත් වත්මන් අධ්‍යාපන පද්ධතියේ ඇති ගැටලුව වන්නේ, ඉගෙන ගත් දෙය ප්‍රතිනිෂ්පාදනය කළ හැකි ද යන්න නොව, ඔබ දන්නා දෙයින් නිස්සාරණය කර නව දැනුම හා වෙනස් වන සමාජ පසුබිමක ඔබේ දැනුම යොදා ගත හැකි ද

යන්න යි. මෙයින් පෙනී යන්නේ සිසුන් හුදෙක් දැනුම හා කුසලතා කටපාඩම් කර ප්‍රතිනිෂ්පාදනය කිරීමට ඉගෙන ගන්නේ නම්, ඔවුන් අතුරුදහන් වන රැකියා සඳහා සූදානම් වීමේ අවදානමක් ඇති බව යි.

වී.ඒන්. දවටවත්ත පෙන්වා දෙන්නේ, අධ්‍යාපනයත් සමාජ වෙනස් වීමත් අතර දෙයාකාර සම්බන්ධතාවක් පවතින බව යි. එනම්, සමාජ වෙනස් වීම්වලට අනුව අධ්‍යාපනය සකස් විය යුතු බවත්, එසේ නැතිනම් අධ්‍යාපනය මගින් සමාජ වෙනස්කම් සිදු කරන බව යි. සමාජයේ සිදු වන වෙනස්කම් සඳහා පුද්ගලයන් සූදානම් කරනු ලබන්නේ අධ්‍යාපනය විසිනි. වෙනස් වන සමාජයට අනුව පුද්ගලයන් හැඩගැස්වීම අනිවාර්යෙන් ම සිදුවිය යුතු දෙයකි. මන්ද යත් දිනෙන් දින අති සංකීර්ණත්වයට පත් වෙන සමාජ, ආර්ථික, තාක්ෂණික හා සංස්කෘතික වෙනස්වීම් මධ්‍යයේ අධ්‍යාපනයෙන් පරිවර්තනයක් සිදු වීම අනිවාර්යෙන් සිදු විය යුත්තේ අධ්‍යාපනය සමාජ රික්තයක සිදු නොවන නිසාවෙනි. එසේ ම රටක අධ්‍යාපනය සමාජ වෙනස්වීම් මත වෙනස් වීම්වලට භාජනය විය යුතු ය. සැකවින් කිවහොත් අධ්‍යාපනය තුළින් සූදානම් කළ යුත්තේ, සමාජයේ තවමත් නිර්මාණය වී නොමැති රැකියා සඳහා සහ තවමත් සොයාගෙන නොමැති නව නිෂ්පාදන කටයුතු කිරීම සඳහා පුද්ගලයන් ය. මේ අනුව සමාජ වෙනස්වීම් සමග පුද්ගලයා සූදානම් කිරීමේ භාරදූර අභියෝගය වන්නේ අධ්‍යාපනයට යි. ඒ අනුව මෙම පරිච්ඡේදයෙන් බලාපොරොත්තු වන්නේ අතීත හෝ වත්මන් සමාජයට වඩා අනාගතයේ දී වෙනස්වන සමාජයේ තිබිය හැකි ප්‍රවනතාවන්ට අනුගත විය හැකි සමාජය වෙනස් වීමකට වඩා යහපත් සමාජ වෙනසකි. එනම්, එම යහපත් සමාජ වෙනස සඳහා අධ්‍යාපනයෙන් විය යුතු කාර්යභාරයත් යහපත්, සමාජ වෙනසට අනුගත විය හැකි පුද්ගලයන් බිහි කිරීමේ දී අධ්‍යාපනයේ කාර්යභාරය සාකච්ඡාවට බඳුන් කිරීම ය.

ඕනෑම රටක අධ්‍යාපන ක්‍රමයකින් අපේක්ෂා කරන්නේ ළමයින්ට තමන් ජීවත්වන සමාජයට හා ලෝකයට අයත් අතීත හා වර්තමාන ඥාන සම්ප්‍රදාය සම්ප්‍රේෂණය කිරීමත් වෙනස්වන අනාගත සමාජයට අවශ්‍යය යි අනුමාන කළ හැකි හෝ පරිකල්පනය කළ හැකි නිපුණතා සම්භාරයක් අත්පත් කර දීමත් ය. මේ නිසා අධ්‍යාපනය ඉදිරියට මෙන් ම පිටුපසට ද මුහුණක් ඇති “ජනුස්” නම් පැරණි රෝම

දෙවියාට උපමා කරයි. ඒ මක්නිසාදයත්, අධ්‍යාපනයෙන්, අතීතයත් වෙනස් වන අනාගතයක් විමසිය යුතු බැවිනි. අධ්‍යාපනයෙන් නිරන්තරයෙන් ම පවතින පරපුරට වඩා උසස් පරපුරක් නිර්මාණය කිරීම අධ්‍යාපනයේ අරමුණ යි. නමුත් වර්තමාන අධ්‍යාපනයෙන් බොහෝ විට සිදුවන්නේ අතීත තොරතුරු ම හැදෑරීම මිස දිනෙන් දින වෙනස් වන සහ සංකීර්ණ වන අනාගත සමාජයට ඔරොත්තු දෙන පරපුරක් බිහි කිරීම නො වේ.

ළමයා යනු අනාගත ලෝකයේ බොහෝ කාලයක් ජීවත් වීමට සිටින කෙනෙකි. එම ළමයා අතීතයේ හා වර්තමානයේ ආලෝකයෙන් අනාගත සමාජයට සූදානම් විය යුතුය. එසේම දිනෙන් දින වෙනස් වන අති සංකීර්ණ සමාජ කම්පනයන්ට පුරුදු විය හැකි පුද්ගලයෙක් බිහි කළ යුතු වේ. එනම් මෙම දිනෙන් දින චලනය වන සමාජය තුළ වෙනස් වෙමින් සමාජ කම්පනයන්ට ඔරොත්තු දෙමින් ජීවත්වීම අති මහත් අභියෝගයකි. මෙම වෙනස් වන සමාජයට අවශ්‍ය සුනම්‍ය භාවය අධ්‍යාපනයෙන් ලැබිය යුතු ය. මේ අනුව වර්තමාන අධ්‍යාපන පද්ධතියෙන් සිදුවිය යුතු කාර්යභාරය අතිමහත් ය.

**සමාජ වෙනස්වීම නිසා අධ්‍යාපනය හමුවේ ඇති අභියෝග**

විසිඑක්වන ශත වර්ෂයට පා තබා ඇති මෙම දශකයේ සිදු වෙමින් පවතින හා සිදුවන වෙනස්කම් රාශියකි. ඉතිහාසයේ කවර කාලයකටත් වඩා ප්‍රවාහන ජාල හා සන්නිවේදන ජාල මගින් අප සැවොම විශ්ව ගම්මානයක වැසියන් වී හමාර ය. එම නිසා සෑම රටකට ම සෑම කෙනකුට ම අන් රටකට හා අන් පුද්ගලයකුගේ බලපෑම්කට ලක් වීමට සිදුව ඇත. සමාජයේ සිදුවන මෙම වෙනස් වීමට මුහුණ දීම අධ්‍යාපනය මුහුණ පා ඇති අභියෝගයකි. එම වෙනස් වන නව සමාජයට උචිත වන අන්දමට පුද්ගලයා හදාවඩා ගැනීම ඔවුන්ට අධ්‍යාපනය ලබාදිය යුත්තේ කෙසේ ද යන්න අධ්‍යාපන ක්‍රියාවලියේ නියුතු වූවන් හට ඇති අභියෝගයකි.

සමාජයේ සිදු වන වෙනස්වීම් සඳහා විද්‍යාව හා තාක්ෂණයේ සිදුවන දියුණුව, සෑම අවුරුදු තුන හතරකට වරක් ම දෙගුණ වන දැනුම සහ ගෝලීයකරණය ප්‍රධාන වශයෙන් හේතු පාදක වී ඇත. ගෝලීයකරණය නිසා, තොරතුරු ව්‍යාප්ත වීම වේගවත් වීම, තරඟකාරී

බව වැඩිවීම, අසමානතාවය වැඩිවීම, රැකියා උත්පාදන ගැටලු, පෞද්ගලික අංශයේ රැකියා ඉහළ යාම, රාජ්‍ය අංශයේ හැකිලීම, ශ්‍රමය නිදහසේ හුවමාරු වීම, සංස්කෘතික සෝදා පාළුව හා අපේකම නැති වීම, මානව වටිනාකම් බිඳ වැටීම යනාදිය දැකිය හැකි ප්‍රධාන ගැටලු වේ. සමාජයේ සිදු වන මෙම වෙනස් වීම් හමුවේ අධ්‍යාපනය මත විශාල අභියෝග රාශියක් මතු වී ඇත. එනම්ඃ

- දැනුම පුපුරා යාම නිසා වේගයෙන් වෙනස් වන දැනුම අත්පත් කර ගැනීමට හැකි වන අයුරින් අධ්‍යාපන අන්තර්ගතයන්, යම් ක්‍රමවේදයන් සහ භාවිතයන් සකස් කර ගැනීමේ අභියෝගය.
- සමාජ වෙනස් වීමට ඔරොත්තු දිය හැකි පුද්ගලයන් නිර්මාණය කිරීමේ අභියෝගය.
- අලුතින් උත්පාදනය වන රැකියා සඳහා ප්‍රවේශ වීමට අවශ්‍ය දැනුම කුසලතා ආකල්ප ලබා ගැනීමේ අභියෝගය.
- විනාශ වී යන සාරධර්ම හා මානව වටිනාකම් ආරක්ෂා කිරීමේ අභියෝගය.
- සැමට අධ්‍යාපනය ලබා දීමේ අභියෝගය යනාදිය යි.

**වෙනස්වන සමාජයට අනුරූපව අධ්‍යාපනය කෙසේ වෙනස් විය යුතු ද?**

සමාජය වෙනස් කිරීමේ වඩාත් ප්‍රබල මෙවලම අධ්‍යාපනය යි. අධ්‍යාපනය පුද්ගලයෙකුට අනුවර්තනය වීමේ හැකියාව ලබා දෙයි. අධ්‍යාපන ඉතිහාසය අන් කිසිදු කලක දී දක්නට නොලැබුණු අත්දැකීම් රාශියක් වර්තමාන සමාජය තුළ ශිෂ්‍යයන් අත්විඳියි. එනම් වර්තමාන සමාජයේ පැතිර යන covid 19 වෛරසය නිසා සිසුන්ට මාර්ගගත ඉගෙනුම් ක්‍රමවේදය (Online teaching) යටතේ ඉගෙන ගැනීමට සිදුව ඇත. විසි එක් වන සියවස සඳහා ඉදිරිපත් කළ Learning: The Treasare Withing වාර්තා වේ සඳහන් වන පරිදි අධ්‍යාපනයේ කලුනු හතරක් පිළිබඳ ව පෙන්වා දෙයි. (Delores, J., 2000). එනම්ඃ

- දැනගැනීමට ඉගෙනීම (Learning to Know)
- කරීමට ඉගෙනීම (Learning to do)
- ජීවත්වීමට ඉගෙනීම (Learning to be)
- එකට ජීවත් වීමට ඉගෙනීම (Learning to live together) යනුවෙනි.

සමාජයේ ජීවත් වන පුද්ගලයන් මෙම කලුනු හතර මත පදනම් වූ අධ්‍යාපනයක් ලබා දෙන්නේ නම් ඔවුන් ජීවිත කාලය පුරාම අධ්‍යාපනය ලබමින් දිනෙන් දින වෙනස් වන සමාජය තේරුම් ගැනීමටත්, එම සමාජයේ ජීවත් වීමට අවශ්‍ය දැනුම පෞරුෂත්වය, කණ්ඩායම් හැඟීම, නිර්මාණශීලීත්වය, ස්වයං පාලනය, පුද්ගලයන් සහ සමාජ වෙනස්කම්වලට ගරු කරමින් ජීවත්වීමට අවශ්‍ය පන්නරය ලබා ගනු ඇත.

**දැන ගැනීමට ඉගෙනීම (ඉගෙන ගැනීමට ඉගෙනීම)**

මෙම කුලුන මගින් අප ජීවත්වන සංකීර්ණ සමාජ වටපිටාව අවබෝධ කර ගැනීමටත් එම සමාජයේ වටිනාකමින් ජීවත්වීමටත් මෙන් ම ස්වයං පාලනයක් සහ තාර්කික ව ජීවත්වීමට අවශ්‍ය දැනුම ලැබේ.

**කිරීමට ඉගෙනීම**

කිරීමට ඉගෙනීම යන්නෙන් වෙනස් වන සමාජය තුළ නිර්මාණාත්මකව හා තාක්ෂණික ඥානයෙන් යුතුව කටයුතු කිරීමට මෙන් ම තාක්ෂණික මෙවලම් භාවිතයෙන් වැඩ පහසුකම් සැපයීම සහ නිෂ්පාදනය ඉහළ නැංවීමට අවශ්‍ය පුහුණුව මෙන් ම සාමූහික ව වැඩවල නිරත වීම මුලපිරීම අවදානම් දැරීම යන ගුණාංග ඉගැන්වීම මෙමගින් අදහස් කරයි. එසේ ම මෙහි දී වෘත්තීය පුහුණුව පමණක් නොව එදිනෙදා ජීවිතයේ වැඩ කර ගැනීමට ඇති හැකියාව මින් අදහස් කරයි.

**එකට ජීවත්වීමට ඉගෙන ගැනීම, අනෙක් අය සමඟ ජීවත් වීමට ඉගෙන ගැනීම**

ගෝලීයකරණයත් සමග සියලු ම ජාතීන් එක ම පවුලේ ඒකකයක් වීම නිසා එකිනෙකාගේ ගෞරවය විවිධත්වය අගය කරමින් අනෙකාට හිරිහැර කිරීමකින් තොරව ජීවත්වීමට ඉගෙනීම මින් අදහස් කරයි. ගැටුම් ශක්තින් හීන වී අනාගත සමාජය වඩා සුහදශීලී සහ ශක්තිමත් එකක් වනු නොඅනුමාන ය.

**ජීවත්වීමට ඉගෙනීම**

අනාගතයේ බිහිවන සංකීර්ණ සමාජය සඳහා පන්ති කාමර ඉගෙනීම පමණක් ප්‍රමාණවත් නොවේ. ශිෂ්‍යාට කියවීම තුළින් ඉගෙනීමට අත්දැකීම් තුළින් ඉගෙනීමට, පරිසරය තුළින් ඉගෙනීමට ගවේෂණයෙන් ඉගෙනීමට අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්ප ලබාදිය යුතු ය.

දිනෙන් දින වෙනස් වීමට ලක්වන අති සංකීර්ණ සමාජයේ පරිපූර්ණ මිනිසෙකු ලෙස හැදී වැඩීමට ඉහත දැක්වෙන අධ්‍යාපනයේ කුලුනු හතර කොතරම් වැදගත් ද යන්නත්, එසේ ම එවන් පරිපූර්ණ මිනිසෙකු බිහිකිරීම සඳහා අධ්‍යාපනය සඳහා ඇති විශාල අභියෝගය පිළිබඳ ව අපට මනාව පසක් වේ.

දැනටමත් අති සංකීර්ණ වූ සමාජයක ජීවත්වන පුද්ගලයින් තවමත් පුරෝකථනය කළ නොහැකි සමාජයකට සූදානම් කිරීම ලේසි පහසු කාරණයක් නොවනු ඇත. නමුත් එම භාරදූර වගකීම ඉටු කළ යුත්තේ අධ්‍යාපනය විසිනි. මේ අනුව විසි එක්වන සියවසේ සෑම සිසුවකුට ම වෙනස් වන ලෝකයේ නොනැසී පැවතීමට අවශ්‍ය වන කුසලතා මොනවාදැයි විමසා බලමු.

Malik, R, S. (2018) ට අනුව ගෝලීයකරණය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ දැනුම පුපුරා යාමේ අභිසාරී බලපෑම නූතන සමාජයේ සුවිශේෂී වෙනස්කම්වලට තුඩු දී ඇති අතර එය අපගේ නූතන ජීවන රටාවේ සෑම අංශයක් ම අභියෝගයට ලක් කර තිබේ. මෙම වෙනස්කම් සමග සාර්ථකව කටයුතු කිරීම සඳහා

මෙම ඩිජිටල් යුගයේ ලක්ෂණයක් වන ඉලෙක්ට්‍රෝනික් තාක්ෂණයන් රාශියක් හැසිරවීමට කුසලතා සමඟ ශ්‍රම බලකාය සූදානම් කළ යුතුය. විශ්වීය දෘෂ්ටියකින් යුත් පුරවැසියන් සූදානම් කිරීම, හරස් සංස්කෘතික අවබෝධය, කණ්ඩායම් ව්‍යාපෘති පිළිබඳ බහු සංස්කෘතික සැකසුම් වැඩ කිරීමේ හැකියාව සහ අධ්‍යාපනය ලබාදීම සඳහා නිර්මාණාත්මකව හා විවේචනාත්මක ව වෙනස් ප්‍රවේශයක් අවශ්‍ය වේ. අධ්‍යාපනය යනු රටක් ගෝලීය වශයෙන් තරඟකාරී පුරවැසියන් සූදානම් කිරීම සඳහා ක්‍රමාංකනය කළ බලවේගයකි. එම නිසා සැමට අධ්‍යාපනය ලබා දීමට (Education for All) වගබලා ගත යුතු ය.

Kay, K. and Greenhill, V., 2011 පෙන්වා දෙන ආකාරයට අධ්‍යාපනයෙහි ඉලක්ක විය යුත්තේ ශිෂ්‍යයන් පහත සඳහන් අන්දමේ පුද්ගලයන් බවට පත් කිරීම යි.

- තොරතුරු විමර්ශකයන්
- දැනුමැත්තන්
- චින්තකයන්
- සන්නිවේදකයන්
- ප්‍රතිපත්ති සහගත වූවන්
- විවෘත මානසිකත්වයකින් යුක්ත වූවන්
- කරුණාවන්තයන්
- අවදානම් දරන්නන්
- සමතුලිත වූවන්
- කල්පනාකාරී වූවන් යනුවෙනි.

එසේම, අබේපාල, ආර්. (2020ඃ 43) දක්වන ආකාරයට වත්මන් සමාජයට එනම් විසි වන සියවසේ ජීවත් වන පුද්ගලයෙකුට අවශ්‍ය නිපුණතා පහත පරිදි පෙන්වා දෙයි. එනම්ඃ

- ගැටලු නිරාකරණය
- නිර්මාණශීලීභාවය
- විශ්ලේෂණාත්මක චින්තනය
- සහයෝගීතාවය
- සන්නිවේදනය
- සදාචාර දර්ශනය, ක්‍රියාව
- වගකිව යුතුභාවය (Accountability) යනුවෙනි.

ඉහත සඳහන් කළ පරිදි වෙනස් වන සමාජය තුළ අධ්‍යාපනය තුළින් ඉහත කී අත්‍යවශ්‍ය නිපුණතා ලබා දිය හැකි ආකාරය පහත පරිදි සාකච්ඡාවට බඳුන් කළ හැකි ය. Global Learning blog වෙබ් අඩවිය දක්වන්නේ 21 වන සියවසේ මෙම පුළුල් නිපුණතාවන්ට වඩා බොහෝ දෙමාපියන් සහ ගුරුවරුන් සාම්ප්‍රදායික අධ්‍යයන විෂය කරුණු සහ විශ්වවිද්‍යාල ප්‍රවේශය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරති. 21 වන ශතවර්ෂයේ අධ්‍යාපනයේ අරමුණු පිළිබඳ ව ක්‍රියාකාරීත්වය සඳහා සම්මුතියක් ඇති කිරීම සඳහා සියලු පාර්ශවකරුවන් අතර වැඩි උපදේශනයක් සහ සාකච්ඡාවක් අවශ්‍ය වේ. 21 වන සියවසේ යෞවනයන් තුළ නිපුණතා වර්ධනය කිරීමට නම් ගුරුවරුන්ට තමන්ගේ ම නිපුණතා වර්ධනය කර ගැනීමේ අවස්ථාවන්ට නිරාවරණය විය යුතු ය. සමීක්ෂණවලින් පෙනී යන්නේ ගුරුවරුන් සාමාන්‍යයෙන් 21 වන සියවසේ නිපුණතා අනුමත කරන නමුත් පන්ති කාමර කාලය ඒ සඳහා වැය නොකරන බවයි.

**ගැටලු නිරාකරණය**

වත්මන් සමාජය දෙස බැලූ විට ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව පුද්ගලයන් තුළ අනිවාර්යයෙන් ම සංවර්ධනය කළ යුතු නිපුණතාවයකි. මන්ද යත්, වර්තමානයේ මෙන් ම අනාගතයේ ද අපට සිතාගත නොහැකි අන්දමේ ගැටලු රාශියක් මතුවනු ඇත. මෙම ගැටලු දිනෙන් දින සංකීර්ණ වනු විනා සරල වීමක් දක්නට නැත.

ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව පුද්ගලයාට අවශ්‍ය වන්නේ එබැවිනි. එනම් මෙහි දී ගැටලු නිරාකරණය කිරීමේ නිපුණතාවය යනු, සුවිශේෂී සහ ප්‍රවේසමෙන් සැලසුම් කරනු ලබන ක්‍රම මගින් වත්මන් කාලය තුළ ඇතිවන සංකීර්ණ ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව යි. ගැටලු නිරාකරණය කිරීමට යම් පුද්ගලයෙක් දක්ෂ වූ විට ඔහුට ස්වාධීනව වැඩ කිරීමට හැකියාව ලැබේ. එසේ ම මෙම පුද්ගලයෝ වැඩක් කිරීමට ආරම්භක ශක්තිය මෙන් ම අවදානම් දැරීමට ද නො පසුබට වෙති. එවැනි පුද්ගලයන් වත්මන් සමාජයට මෙන් ම ශ්‍රම බලකායට ද විශාල සම්පතක් වන අතර ඔවුන් සමාජීය වර්ධනය හා සංවර්ධනය සඳහා විශාල පිටිවහලක් වනු ඇත.

## නිර්මාණශීලීභාවය

වෙනස්වන සමාජයට අනුව හැඩගැසීම සඳහා අධ්‍යාපනයෙන් ශිෂ්‍යයන් තුළ නිර්මාණශීලීත්වය ඇති කිරීම ඉතාමත් කාලෝචිත ය. සමාජ වෙනස් වීමත් සමග ම අලුතින් උද්ගතවන තත්ත්වයන්ට මුහුණ දීම සඳහා එතෙක් අනුගමනය කරන ලද ක්‍රම උචිත නොවිය හැකිය. එම නිසා සමාජය තුළ උද්ගත වන නවත ම තත්ත්වයන්ට සාර්ථකව මුහුණ දීම සඳහා පුද්ගලයන් තුළ අධ්‍යාපනය තුළින් නිර්මාණශීලීත්වය ඇතිකිරීමට උත්සාහ කළ යුතු ය. තමන් අනුගතව සිටින ඕනෑම පරිසරයක හෝ ඕනෑම විෂයක නිර්මාණශීලීව සිතීමට, වැඩ කිරීමට පුද්ගලයන්හට අධ්‍යාපනයෙන් හැකියාව ලබාදිය යුතු ය. අධ්‍යාපනයෙන් සෑම විෂයක ම පුද්ගලයන් තුළ ප්‍රතිභාව නිර්මාණශීලීත්වයෙන් ඇති කළ යුතු ය. සාමාන්‍යයෙන් ප්‍රතිභාව යන්න විග්‍රහ වනුයේ සාහිත්‍යයේ ය. එහෙත් සෑම විෂයක් තුළ ම පුද්ගලයන්ගේ ප්‍රතිභාව ඇති කළ යුතු යි. ප්‍රතිභාව යනු පෙර නොවූ විරූ දෑ නිර්මාණය කිරීමේ හැකියාව යි. එනම් ප්‍රතිභාව සාහිත්‍යයේ එන කවිය තුළින් පමණක් නොව සෑම විෂයක් තුළින් ම පෙර නිර්මාණය නොවූ දේවල් නිර්මාණය කිරීමේ ශක්‍යතාවය අධ්‍යාපනය තුළින් ලබා දිය යුතු යි.

## විශ්ලේෂණාත්මක චින්තනය

දිනෙන් දින වෙනස් වෙන අති සංකීර්ණ සමාජ පරිසරයක ජීවත්වන පුද්ගලයා විචක්ෂණශීලි ලෙස කටයුතු කිරීම අත්‍යවශ්‍ය ය වේ. ඒ සඳහා පුද්ගලයා ප්‍රබුද්ධ අධ්‍යාපනයක් අත්කර ගත යුතු ය.

විචාරශීලී මනසකින් යුක්ත පුද්ගලයන් බිහි කිරීම අධ්‍යාපනයේ උසස් පරමාර්ථයක් බව ආර්. එස්. පීටර් නම් දාර්ශනිකයාගේ අදහස වේ. හංසයා දියෙන් කිරි වෙන්කර ගන්නා සේ මෙම අති සංකීර්ණ සමාජය තුළ ඇති හොඳ නරක ද සත්‍ය අසත්‍ය ද වෙන් කොට ගැනීමේ හැකියාව අත් කරගැනීම අධ්‍යාපනයෙන් ලබන අග්‍ර ඵලයකි. එනම් අධ්‍යාපනය තුළින් පුද්ගලයා තුළ විචාරශීලී සාක්ෂර භාවය (Critical Literacy) ඇති කළ යුතුය.

ආර්. ගුණවර්ධන, හා ආර්. අබේපාල, (2017) පෙන්වා දෙන ආකාරයට බෙන්ජමින් බ්ලූම් ගේ අරමුණු වර්ගීකරණය අනුව විශ්ලේෂණාත්මක චින්තනය යනු, උසස් මානසික චින්තන ක්‍රියාවලියකි. සමාජයේ සිදු වන යම් සංසිද්ධි තමන් විසින් ම එහි සමාන අසමානතා හඳුනා ගැනීම, ඇගයීම, සංස්ලේෂණය කිරීම සහ භාවිතයෙහි යෙදීම යන කාර්යයන් හි නිරතවීමේ හැකියාව මින් අදහස් කරයි. එසේ ම විශ්ලේෂණාත්මක චින්තනය යනු, තොරතුරු චතුරතාව හා සම්බන්ධ සුවිශේෂ ලක්ෂණයකි. පුද්ගලයකු අධ්‍යාපනයෙන් විශ්ලේෂණාත්මක චින්තනය ඇති කළ යුතු ය. එවිට විශ්ලේෂණාත්මක චින්තනය සහිත පුද්ගලයන් සමාජයේ ඇති දත්ත සහ තොරතුරු දෙස බලන්නේ විවිධ කෝණයන් සහ මානයන් ඔස්සේ ය. ඔවුහු සතු විශ්ලේෂණාත්මක චින්තනය සමාජය තුළ පවතින ගැටලු සමාජීය හා විද්‍යාත්මක ස්වභාවයකින් විශ්ලේෂණය කිරීමට දක්ෂයෝ වෙති. අප ජීවත්වන සමාජීය ඵලදායි තීරණ ගැනීම සඳහා අධ්‍යාපනයෙන් එම විශ්ලේෂී හැකියාව ලබා දීම අත්‍යවශ්‍ය ය.

**සහයෝගීතාවය**

සී. කාරියවසම්, (2010) ට අනුව ශ්‍රී ලංකා අධ්‍යාපනය තුළ දක්නට ඇති පැහැදිලි රික්තකයක් නම් ජාතීන් අතර සහයෝගීතාවය ඇති කිරීමට උත්සාහයක් හෝ උනන්දුවක් නොමැතිවීමෙන් හටගත් ඉතා අභාග්‍යසම්පන්න ප්‍රතිඵල යි. එම ප්‍රතිඵල බොහෝ ප්‍රමාණයක් අප අත්විඳ ඇති අතර දැනටත් අත් විඳිමින් පවතී. සමාජ වෙනස් වීමත් සමග අප ජීවත් වන බහු සංස්කෘතික සමාජයේ එකිනෙකාට ගරු කරමින් විවිධත්වය තර්ජනයක් නොව ආශිර්වාදයක් කොට සැලකීමට අධ්‍යාපනය තුළින් පුද්ගලයා තුළ ප්‍රබුද්ධ මානසිකත්වයක් ඇති කළ යුතු ය.

සමාජයේ සිදුවී ඇති ප්‍රාථමික වෙනස සමග පුද්ගලයන් යටත් විජිත යුගයකට පා තබා ඇත. ඔවුන් නිරායාසයෙන් ම සමාජ මාධ්‍ය වෙබ් අඩවි ඔස්සේ සමාජශීලී බව හා සහයෝගීතාවය පවත්වාගෙන යති. වත්මන් සමාජයේ සිදු වී ඇති වෙනස කොපමණ ද යන්න මනාව පැහැදිලි වන්නේ, සමාජ ජාලා වෙබ් අඩවි ඔස්සේ ශිෂ්‍යයන් පවත්වාගෙන යන සතුටු සාමීචි සහ තොරතුරු හුවමාරු කිරීම් පාසලේ සිදු කළ නොහැකි වූ විට ඔවුන් ඉගෙනීමට හෝ උනන්දුවක් නොදැක්වීම තුළිනි.

සමාජ වෙනසක් සමග ම අප පුද්ගලයන්ට අධ්‍යාපනය දිය යුත්තේ ගෝලීය ඩිජිටල් පුරවැසිභාවයට අනුකූල වන ආකාරයට ය. එනම් භෞතික මෙන් ම භෞතික නොවන අවකාශවල දී ද ගෝලීය ජනගහනයන් සමග ම සන්නිවේදනය සහ අලෙවිකරණයේ නිරත වීමට මෙන් ම සහයෝගයෙන් වැඩ කිරීමට හා සහයෝග යෙන් සන්නිවේදන යෙදීමේ හැකියාව ද අධ්‍යාපනය තුළින් ලබා දීම අත්‍යාවශ්‍ය ය.

**සන්නිවේදනය**

සමාජ වෙනස් වීමත් සමඟ පුද්ගලයන් ලිඛිත, මුද්‍රිත මාධ්‍යයෙන් පමණක් නොව නොයෙකුත් ආකාරයේ බහු මාධ්‍යය ඔස්සේ ද සන්නිවේදනයේ යෙදෙති. මේ සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම නොහොත් මාධ්‍ය චතුරතාව ශිෂ්‍යයන් තුළ ඔප් නැංවිය යුත්තේ අධ්‍යාපනය තුළින් ය. පුද්ගලයෙකුගේ සාරධර්ම සහ විශ්වාසයන් අර්ථ දැක්වෙන්නේ ඔවුන් අන් අය සමග කොතරම් හොඳින් සන්නිවේදනය කරනවා ද යන්න මතය. ඔවුන්ගේ සන්නිවේදන කුසලතාවන් හි සෑම අංශයක් ම වර්ධනය කර ගැනීමට හා දියුණු කිරීමට ඔවුන් දිරිමත් කිරීමෙන් ඔවුන්ගේ පෞද්ගලික හා වෘත්තීය ජීවිතයේ හොඳින් සේවය කරනු ඇත.

**සදාචාර ධර්ම ක්‍රියාව සහ වගවීම**

අබේපාල, (2020) ට අනුව සදාචාර ධර්ම ක්‍රියාව සහ වගකීම යන්නට යම් දෙයකට අනුගත වීමේ හැකියාව, මූල්‍යමය වගකීම, පුද්ගලික වගකීම, පරිසර සංජානනය, සංවේදනය, දරා සිටීමේ

හැකියාව සහ ගෝලීය සංජානනය ඇතුළත් වේ. සමාජ වෙනස් වීමත් සමග මානව වර්ගයාට ම අය අත් වී ඇති ඉරණම වන්නේ මානව හිමිකම් විරහිත ලෝකයක ජීවත් වීමට එහි දී ස්වභාව ධර්මය විනාශ වී යාම, අලුත්වැඩියා කළ නොහැකි සම්පත් වියැකී යාම, දරිද්‍රතාවය ව්‍යාප්ත වීම, අවි තරගය ජාත්‍යන්තර ත්‍රස්තවාදය, පරිසර දූෂණය, පානීය ජල හිඟය, මත්ද්‍රව්‍ය භාවිතය මානව හිමිකම් උල්ලංඝනය යන සියල්ලේ ම සමුච්චිත ප්‍රතිඵලය වන්නේ අපි ජීවත් වෙන සමාජය තුළ සාරධර්ම පිරිහී යාමකි.

අවසාන වශයෙන් කිවයුත්තේ, සමාජය කොතරම් වෙනස් වීම්වලට ලක් වී තාක්ෂණික යුගයක ජීවත් වූවත් අපේ මුතුන් මිත්තන් අපට දායාද කර දුන් අතීත උරුමයන්, අපේ සංස්කෘතික උරුමයන්, හෙළ වෙදකම, පැරණි ඉංජිනේරු තාක්ෂණය වැනි උරුමයන් රැක ගැනීමට ත්, ඒවා අනාගත පරපුර වෙත දායාද කිරීමට ත් අවශ්‍ය දැනුම ආකල්ප සහ කුසලතා ලබාදීමට අධ්‍යාපනයෙන් කටයුතු කළ යුතු ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අබේපාල, ආර්, (2020). *21 සියවසේ ඉගෙනුම් නිපුණතා,* කොට්ටාවඃ සාර ප්‍රකාශන.

කාරියවසම්, සී, (2010). *අධ්‍යාපනයෙන් බිහි කලයුතු ශ්‍රී ලාංකිකයා,* කොට්ටාවඃ සාර ප්‍රකාශන.

ගුණවර්ධන, ආර්., අබේපාල, ආර්. (2017). *ගුරු වෘත්තීය සංවර්ධනය උදෙසා අරමුණු වර්ගීකරණය,* කොට්ටාවඃ සාර ප්‍රකාශන.

දවටවත්ත වී.ඒන්. *ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා අධ්‍යාපන සමාජ විද්‍යාව.*

Delores, J., 2000. *The four pillars of education. Education horizons*, 6(3), pp.14-18.https://search.informit.org/doi/abs/10.3316/aeipt.105993. Retrieved on 2/05/2021

Gurría, A. (2009). *Education for the future-promoting changes in policies and practices: The way forward. Remarks delivered at the Education Ministerial Round Table*, UNESCO, Paris, France. Retrieved December,29,2009. https://www.oecd.org/education/educationforthefuture-promotingchangesinpoliciesandpracticesthewayforward.htm

Kay, K. and Greenhill, V., 2011. *Twenty-first century students need 21st century skills. In Bringing schools into the 21st century* (pp. 41-65). Springer, Dordrecht. https://link.springer.com/cher/10.1007/978-94-007-0268-4_3 Retrieved on 2/05/2021

Sedere, M. U. (2016). *Educational Reforms beyond Kannangara for the 21st Century*: Dr. CWW Kannangara Memorial Lecture. Online Submission. https://eric.ed.gov/?id=ED569342

https://www.sltestu.edu.lk/files/Sociology/Social%20Change.pdf

Malik, R. S. (2018). *Educational challenges in 21st century and sustainable development*. Journal of Sustainable Development Education and Research, 2(1), 9-20. https://ejournal.upi.edu/index.php/JSDER/article/view/12266

Wilterdink, N. and Form,. William (2020, November 16). *Social change. Encyclopedia Britannica*. https://www.britannica.com/topic/social-change

https://asiasociety.org/global-cities-education-network/preparing-students-21st-century